**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ නිවැරදිව ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සූර්ය විදුලි බල පද්ධතියෙන් සමාලෝචිත වර්ෂයේ ජාතික පද්ධතියට විදුලිය ඒකක 5024 ක් ලබා දී තිබුණු අතර, පරිභෝජනය කළ ඒකක ප්‍රමාණය 7999 ක් විය. විදුලිය වියදම් ගිණුම් ගත කිරීමේදී පරිභෝජනය කල ප්‍රමාණය නිෂ්පාදනය කළ ප්‍රමාණයට හිලව් කර බිල්පත් පියවීම හේතුවෙන් විදුලි ඒකක 5024 ට අදාළ ආදායම හා ඒකක 7999 ට අදාළ වියදම මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි. | පරිභෝජනය කල ඒකක ප්‍රමාණය නිෂ්පාදනය කල ඒකක ප්‍රමාණයට හිලව් කර වෙනස පමණක් ගිණුම්ගත කරන බැවින් නිෂ්පාදනය කල ඒකක ප්‍රමාණයට අදාල වියදම හා ආදායම වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවල හෙළි දරව් කිරීමට නොහැකි වී ඇති බව. | ආදායම හා වියදම ගිණුම්ගත කල යුතුය. |

**(ආ) මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය ලෙජරය අනුව යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් රු.3,971,948 ක් ලෙස දක්වා තිබුණු අතර, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA 06) එය රු.3,779,948 ක් වූයෙන් රු.192,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වත්කම් අවසන් වාර්තාවේ වත්කම් අත්පත් කර ගැනීම් යටතේ පෙන්නුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂයට එකතුවීම් යටතට එකතු වීම හේතුවෙන් මෙම වෙනස ඇති වි ඇති බව. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් සසඳා වෙනස්කම් නිවැරදි කර ගැනීමට කටයුතු කල යුතුය. |

(ඇ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් උප කාර්යාල 05 ක ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | කොත්මලේ, නුවරඑළිය හා වලපනේ උප කාර්යාල පවත්වා ගෙන යන ගොඩනැගිලි වෙනත් ආයතන සතු ඒවා බැවින්, අයිතිය පවරාගත් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත්, අඹගමුව හා හඟුරන්කෙත උප කාර්යාල පවත්වාගෙන යන ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කරන බව. | වත්කම් ගිණුම්ගත කල යුතුය. |

(ඇ) අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඒසීඒ - 3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණු, 2013 වර්ෂයේ සිට පැවත එන රු.900,878 ක අග්‍රිම ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නීතීමය කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | නොපියවූ අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සමෘද්ධි අංශය හා සමගාමීව ක්‍රියාත්මක කරන ලද සමාලෝචිත වර්ෂයේ හරිත දැයක් ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධි කාර්යාලයෙන් ගෙවතු 2939 ක් සඳහා ප්‍රසම්පාදන ක්‍රම වේදයකින් තොරව විවිධ වර්ගයේ පැල 117,560 ක් රු.529,020 කට මිලදී ගෙන තිබුණි. මෙම ගෙවීමට අදාල වවුචර් සමඟ බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. | අදාල මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි බැංකු කළමනාකරුවන් වෙත නිදහස් කර ඇති බවත්, එම මුදල් අදාල තවාන් කරුවන්ගේ පුද්ගලික ගිණුම්වලට බැර කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අවස්ථා 06 කදී ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය විසින් ලබාදි තිබුණු රු.1,081,650 ක මුදලක් අදාල කාර්යය ඉටු නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | අදාළ මුදල් අරමුණු ගත කාර්යයට යෙදවිය යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ ගම්පෙරළිය කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන සඳහා සූර්යය බල පද්ධති ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු 17,200,380.ක් වැයකර ආගමික ස්ථාන ක සවිකර තිබුණු සූර්යය බල 14 පද්ධතින් මඟින් ස්ථාපනය වන විදුලිය ජාතික විදුලි පද්ධතියට එකතු කිරීම වර්ෂය .අවසාන දින වන විටත් සිදු කර නොතිබුණි | විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කර මෙම කටයුත්ත අවසන් කර ගැනීමට කටයුතු කරන බව | නිෂ්පාදනය කරන විදුලි ඒකක ජාතික විදුලි පද්ධතියට එකතු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවිධ සංවර්ධන වැඩ සටහන් සඳහා 2019 - 2022 අතර කාලය තුළ ලබාදී තිබුණු රු.1,730,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මෙම ව්‍යාපෘති මෙම වසර තුලදී ක්‍රියාත්මක කර අවසන් කිරීමට සැලසුම් කර ඇති බව. | ලැබුණු මුදල් අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 මැයි 04 දිනැති අංක DMC/Miti/Pro/NuwaraEliya/2021/01 දරන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් වලපනේ ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට කටයුතු කර තිබුණු අතර, උක්ත ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.18,912,660ක් ගෙවා තිබුණද, ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන ලද අරමුණ හා ප්‍රතිඵල ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | කර්මාන්තය සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනාවක් අදාල අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව. | ප්‍රතිපාදන ලබාගෙන විධිමත් අධීක්ෂණයක් තුලින් වැඩ නිම කර ගැනීමට කටයුතු කල යුතුය. . |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රතිලාභීන් 30 දෙනෙකු සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදක කට්ටල සපයා නොතිබියදී ක්ෂුද්‍ර ජල පද්ධති හා අනෙකුත් උපාංග වෙනුවෙන් රු.3,239,975 ක චෙක්පත් ලියා පසුව තැන්පත් ගිණුමට බැරකර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනැති අංක GA/NE/AGRI/YE project-දරන දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක අධ්‍යක්ෂ ඇමතු ලිපිය මගින් මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට සියයක් ලෙසට දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ව්‍යාපෘතියේ කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | 2021 වර්ෂයට අදාල ක්ෂුද්‍ර ජල සම්පාදන කට්ටල 20 ක් ලැබී නොමැති බවත්, මින් ඉදිරියේදි මෙවැන්නක් නැවත සිදු නොවන්නට කටයුතු කරන බව. | භාණ්ඩ ලැබීමකින් තොරව චෙක්පත් ලිවීම නොකළ යුතු අතර විධිමත් අධීක්ෂණයකින් ව්‍යාපෘතිය නිම කළ යුතුය. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 හා 2022 කාල පරාසය තුල රු.5,849,155 ක් වැයකර ඉදිකර තිබුණු වටවල වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම, විදුලිපුර දකුණ පුස්තකාලයේ ඉහළ මාලයේ ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම, මස්කෙළිය ස්වයං රැකියාකරුවන් සඳහා කර්මාන්ත ශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරිම හා කිරිවත්එළිය පතන ප්‍රජා ශාලාව ඉදිකිරීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල අරමුණු සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි. | රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයෙන් අදාල ගොඩනැගිල්ල භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කරන බව. | අදාළ ගොඩනැගිලි සම්පූර්ණ කර අරමුණුගත කාර්යයට යෙදවිය යුතුය. |
| (ආ) | ග්‍රාම ශක්ති වැඩ සටහන යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ මල් වගාකරුවන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා 2019 වර්ෂයේදි රු.8,992,000 ක් වැය කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකරන ලද ආරක්ෂිත ගෘහ 29 ක් ගලවා ඉවත් කර, වලපනේ ගල්කඩපතන ග්‍රාම ශක්ති ජනතා සමිතිය වෙත ලබාදී තිබුණද, කිසිඳු ඵලදායි කාර්යයක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. ආරක්ෂිත ගෘහ 02 ක් විනාශ වි තිබුණු අතර, එක් ගෘහයක් අස්ථානගත වි තිබුණි. මේ හේතුවෙන් රජයට සිදුවී තිබුණු අලාභය රු.843,000 ක් විය. | රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රතිපාදන මත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව | අරමුණුගත කාර්යයන් ඉටුකරගැනීමට කටයුතු කල යුතුය. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 802(1) ප්‍රකාරව කටයුතු නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත්, එකතුව රු.5,683,929 ක වාහන දෙකක් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි. | එක් වාහනයක් මේ වන විට ඌණ උපයෝජිත තත්ත්වයේ පවතින බවත්, අනෙක් වාහනය අමාත්‍යාංශයේ අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු කරන බව. | අදාළ වාහන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |